# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2121/4 – 2019 අප්‍රේල් 29 වැනි සඳුදා – 2019.04.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2018/91.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එන්. ශීලියා ශාන්තිනී මිය, අංක 555සී, පන්සිල්පුර පාර, පන්සිල්ගොඩ, මීනුවන්ගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2018/91.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත
## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එන්. ශීලියා ශාන්තිනී මිය, අංක 555සී, පන්සිල්පුර පාර, පන්සිල්ගොඩ, මීනුවන්ගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක.

*ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,*

“ කම්කරු විනිශ්චය සභා නියෝගය අනුව සේවයේ පුනපත් කිරීම ක්‍රියාත්මක කළ යුතු වූ අවසාන දිනය වන 2011.01.17 දින සිට, සේවයේ පුනපත් කිරීම සත්‍ය වශයෙන් සිදුකර ඇති 2015.11.02 දින දක්වා වන කාලයට අදාළව වැටුප් හා අනෙකුත් හිමිකම්, එන්. ශීලියා ශාන්තිනී මියට ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ්, වෙතින් හිමිවිය යුතුද? හිමිවිය යුතු නම් එකී ගණනය කිරීම් ආදිය කෙසේ සිදුකළ යුතුද? යන්න පිළිබඳ වේ.”

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 208

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.